# දිවිකතරේ සැඳෑ අඳුර



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# දිවි කතරේ සැඳෑ අඳුර

( දසවන මුද්‍රණය )

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.

**ISBN 978-955-1255-21-3**

ප්‍රකාශනය
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය

2009

# ධර්මදානයකි

## මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.


| | | |
|---|---|---|
| ප්‍රථම මුද්‍රණය | - | **2001** දෙසැම්බර් |
| දෙවන මුද්‍රණය | - | **2004** මැයි |
| තෙවන මුද්‍රණය | - | **2005** මාර්තු |
| සිවුවන මුද්‍රණය | - | **2005** මැයි |
| පස්වන මුද්‍රණය | - | **2006** ජනවාරි |
| සවන මුද්‍රණය | - | **2006** පෙබරවාරි |
| සත්වන මුද්‍රණය | - | **2006** අගෝස්තු |
| අටවන මුද්‍රණය | - | **2007** මාර්තු |
| නවවන මුද්‍රණය | - | **2008** මාර්තු |
| දසවන මුද්‍රණය | - | **2009** පෙබරවාරි |


## පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.

2. රෝයල් ඉන්ස්ටිටියුට්,
191, හැව්ලොක් පාර, කොළඹ 5.

3. ඩී.ටී. වේරගල මහතා
422, වැලිපාර, තලවතුගොඩ

4. අනුර රූපසිංහ මහතා
27, කොළඹ වීදිය, මහනුවර.

5. හේමා රූපසිංහ මිය
26, හැව්ලොක් පාර, ගාල්ල.

6. මහා භාරකාර දෙපාතීමේන්තුව
2, බුලර්ස් පටුමග, කොළඹ 07.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net


මුද්‍රණය
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැහිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
දු.ක. 0114-870333

'බ්‍රහ්මාති මාතාපිතරෝ -
- පුබ්බා චරියාති වුච්චරේ'

හබරාදුව, කටුකුරුන්දේ විසූ. නැසීගිය විදුහල්පති,
එච්. ඇන්. අභයවර්ධන, ආචාරිනී එල්. වීරසේකර
අප දෙමාපියන්ට පින් පිණිස

ධර්ම දානයක් වශයෙන්
පළ කරන ලදී.

# දිවිකතරේ සැඳෑ අඳුර
**(දසවන මුද්‍රණය)**

දහම් ලැදියන්ගේ ධර්මාවබෝධය දියුණු කිරීමේ පරමාර්ථයෙන් මෙම දසවන මුද්‍රණය එළිදක්වන මීරිගම පින්වත් පිරිසට එම ධර්මදානමය කුශලය පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

- සම්පාදක

(2552) 2009 පෙබරවාරි

# හැඳින්වීම
(ප්‍රථම මුද්‍රණය)

ජීවිතයක කම්පන, පීඩන, අසහන බහුල වන්නේ යථාර්ථයට මුහුණ දීමට අසමත් වූ විටය. ජීවිතයෙහි සොඳුරු පැත්තම මිස අඳුරු පැත්ත ගැන නොතකන පටු ජීවන දෘෂ්ටියක දැඩිව එල්බගත් විටය. අප තිලෝගුරු බුදු පියාණන් වහන්සේ ලොවට හඳුන්වා දුන් පුළුල් ජීවන දර්ශනය, ලොවුතුරු සැනසුමකට මග හෙළිකරන්නකි. සොඳුරු - අඳුරු දෙපැත්තෙහිම ඇති තතු යථාර්ථවාදීව පෙන්වා වදාළ උන්වහන්සේ අකම්ප්‍ය උපේක්ෂාවකට සිත ගෙන එන අයුරු ලෝකයාට පහදා දුන්හ.

"ජරාව - ව්‍යාධිය - මරණය කියන මේවා පිළිගැනීමට අප සූදානම්ව සිටිය යුතු නේද? මේවා ගැන දෙසුමක් ලියා එවුවොත් අප දෙමාපියන්ට පින් පිණිස පළ කළ හැකියි. " යනුවෙන් අප දෙටු සොහොයුරු , හොරණ ඇල්බට් පීරිස් මාවතේ අංක 15/9 හි නිවැසි ඩී. ඇන්. අභයවර්ධන මහතා කළ කාලෝචිත ඇරයුම අනුව මෙම විශේෂ දෙසුම පටිගත කරන්නට යෙදුනි. ගුරු වෘත්තියටම ජීවිතයේ වැඩි කාලයක් කැප කර, අසූවිය ඉක්මවා පරලෝ සැපත් අප දෙගුරුන්ගෙන් දූ දරුවන් උගත් අවසාන 'පාඩම ' ද ජරාව, ව්‍යාධිය හා මරණයමය.

'දිවිකතරේ සැඳෑ අඳුර ' නමින් එළි දකින මෙම දම් දෙසුම 'ධර්මදානයක් වශයෙන් බෙදා හැරීමෙන් ජනිතවන කුශලය අප හැදූ වැඩූ මව්පිය දෙපොළ අනුමෝදන් වෙත්වා ! එය ඔවුන්ගේ අමාමහ නිවන්සුව පිණිසම හේතු වාසනා වේවා ! එසේම මෙහි " බරපැන් " ඉසිලූ අප දෙටු සොහොයුරු ඇතුළු සොයුරු සොයුරියන්ට ද මෙම ධර්ම දානමය කුශලය වහා වහා නිවන් අවබෝධ කරගැනීමට උපනිශ්‍රය සම්පතක්ම වේවා !

මෙයට
සසුන් ලැදි,
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර
දේවාලේගම
(2542) 2001 දෙසැම්බර් 04

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ. එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි...." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කළ "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අයහට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුණු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථ එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

2, බුලර්ස් පටුමග
කොළඹ 07.
1997 ජුලි 1

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.


ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය<br>
රෝයල් ඉන්ස්ටිටියුට්<br>
අංක 191, හැව්ලොක් පාර<br>
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම

දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම

2000 ජුනි 05 (2544 පොසොන්)

# දිවි කතරේ සැඳෑ අඳුර

උදේට උදාවන ඉර හවසට බැහැලා යනවා. අරුණින් ඇරඹෙන දවසේ ආලෝකය සැඳෑ අඳුරින් කෙළවර වෙනවා. සොබාදහමට අනුව දවසට හිමි මේ ධර්මතාව අපේ ජීවිතයටත් පොදුයි. හිරු අවරට යන බව අපට පහසුවෙන් වැටහෙන නමුත් ජීවිතය අවරට යන බව සාමාන්‍යයෙන් අමතක වෙනවා. ජරා ව්‍යාධි මරණ යන පද තුන බුදු පියාණන් වහන්සේ අපට නිතර සිහිපත් කර දෙන්නේ ඒ නිසයි.

අප තුළ තිබෙන මත් වීම් තුනක් නිසා ජරාව ව්‍යාධිය මරණය කියන කාරණා අපට නිතර අමතක වෙනවා. මොනවද මේ මත්වීම් තුන? බුදු පියාණන් වහන්සේ ඒවා හඳුන්වන්නේ, යොබ්බන මද, ආරෝග්‍ය මද, ජීවිත මද, කියලා. තරුණබව නිසා ඇතිවන මාන්නය, නිරෝගීබව නිසා ඇති වන මාන්නය, තමා ජීවත් වෙනවා කියන අදහස තුළින් ඇති කරගන්නා මාන්නය. මෙන්න මේ මාන්නයෙන් උදම් වුනහම, කෙනෙකුගේ ජීවිතයේ යථාර්ථය අමතක වෙනවා. සිහිබුද්ධිය යටපත් වෙනවා. ඒ සිහිමුළාව නිසාම අසහනය, කම්පනය, සිත්තැවුල්, බලාපොරොත්තු කඩවීම්, දුක්පීඩා, වැඩි වෙනවා. ජරාව ව්‍යාධිය මරණය කියන කාරණා නිතර සිහිපත් කරගැනීම තුළින් ඒ කියාපු මත් වීම් වලින් මිදිලා යථාර්ථයට සිත ගෙන එන්න පුළුවන් වෙනවා. අසහනයෙන් තොරව, අකම්පිතව, උපේක්ෂාවෙන් යුක්තව, තමන් දිරන

බව, ලෙඩවෙන බව, මැරෙන බව, පිළිගන්න ආත්ම ශක්තියක් ඇති වෙනවා.

මෙන්න මේ සිහිපත් කර ගැනීමට එදිනෙදා ජීවිතයේ අපට දකින්නට ලැබෙන සාධක උපකාර කර ගත යුතුබව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්නා. අපට නිතර දකින්නට ලැබෙන මහල්ලා, රෝගියා, මළ සිරුරු, දේවදූතයින් හැටියට සැළකිය යුතු බවත් වදාළා. මොකද ඒවාට දේවදූතයින් කියන්නේ? අපට හිමි ඉරණම කල්තබා දන්වන, අනාවැකි පළ කරන, දේවල් නිසයි. මෙන්න මේ දේවදූතයින් තුන් දෙනා හරියාකාරව පිහිට කර ගත්තොත් අර කියාපු ඒ නොවැළැක්විය හැකි ඉරණමට මුහුණ දෙන්නත්, ඒවා හමුවේ හිත හදාගන්නත්, අපට පහසු වෙනවා ඇති. ඒ වගේම, ඒ මත් වීම් නිසා සිදු කෙරෙන දුසිරිත් වලින් වැළකිලා සුසිරිත් මගට යොමු වෙලා, දුගතියෙන් මිදිලා සුගතිගාමී වෙන්නත් පුළුවන් වෙනවා. එහෙම කල්පනා කරලා බලන කොට ඒ නිමිති තුන ඇත්ත වශයෙන්ම දේවදූතයින් හැටියට, දෙව් ලොවින් එවාපු පණිවුඩ කරුවන් හැටියට සළකන්න පුළුවන්. බෝධිසත්ත්ව සිද්ධාර්ථ කුමාරයාට මේ පෙරනිමිති තුන මහබිනික්මන් කරන්නත්, ලොව් තුරා බුදු බව ලබාගන්නත් උපකාර වුනා. ජාති ජරා ව්‍යාධි මරණ ආදි සියළු සංසාර දුකින් මිදිලා නිවන් දකින්නත් උපකාර වුනා.

ජරාව ව්‍යාධිය මරණය කියන කාරණා, උපන් හැම සත්ත්වයාටම පොදු, ජීවිතයක නොවැළැක්විය හැකි දේවල් බව සිහියට නගා ගැනීමෙන්, දැඩි දුක් දොම්නස් හැඬීම් වැලපීම් තුනී කරගත හැකි බවත් බුදු පියාණන් වහන්සේ සූත්‍ර කිහිපයකම දේශනා කොට වදාළා.

අංගුත්තර නිකායේ පංචක නිපාතයේ එන එක සූත්‍රයක බුදුපියාණන් වහන්සේ දේශනාකරනවා කිසිම කෙනෙකුන් විසින් ලබාගත නොහැකි කාරණා පහක් ගැන: "මහණෙනි, ශ්‍රමණයකුටවත් බ්‍රාහ්මණයකුටවත් දෙවියෙකුටවත් මාරයාටවත් බ්‍රහ්මයාටවත් මේ ලෝකයේ කිසිම කෙනෙකුටවත් ලබාගත නොහැකි කාරණා පහක් තියෙනවා. මොනවද ඒ කාරණා පහ? දිරීම් ස්වභාවය ඇති දේ නොදිරාවා කියන මේ කාරණය, ශ්‍රමණයකුටවත් බ්‍රාහ්මණයකුටවත් දෙවියකුටවත් මාරයාටවත් මේ ලෝකයේ කිසිම කෙනෙකුටවත් ලබා ගත නොහැකි කාරණාවක්. ඒ වගේම ලෙඩ වෙන ස්වභාවය ඇති දේ ලෙඩ නොවේවා කියන එක. මැරෙන ස්වභාවය ඇති දේ නොමැරේවා කියන එක. ගෙවී යන ස්වභාවය ඇති දේ නොගෙවේවා - ගෙවී නොයේවා - කියන එක. නැසෙන ස්වභාවය ඇති දේ නොනැසේවා කියන එක. මෙන්න මේ කාරණා පහ කිසිම කෙනෙකුට, ශ්‍රමණයෙකුටවත්, බ්‍රාහ්මණයෙකුටවත්, දෙවියෙකුටවත්, මාරයාටවත්, බ්‍රහ්මයාටවත් මේ ලෝකයේ කිසිම කෙනෙකුට ලබාගත නොහැකි කාරණා හැටියට බුදු පියාණන් වහන්සේ දක්වනවා.

ඊළඟට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ කාරණා ඉදිරිපත් උනහම ධර්මය දන්නේ නැති පෘථග්ජන පුද්ගලයා ඒවායින් පීඩාවට පත්වන ආකාරය. ඒ පුද්ගලයා දිරන සුළු දේ දිරුවහම මෙන්න මෙහෙම නුවණින් කල්පනා කරන්නේ නැහැ. "මගේ පමණක්ම දිරන සුලු දේ දිරනවා නොවෙයි. යම්තාක් සත්ත්වයින් මේ ලෝකයේ උපදිනවානම් ඒ හැම සත්ත්වයාගේම දිරන ස්වභාවය ඇති දේ දිරනවාමයි.

ඉතිං මම දිරනසුලු දේ දිරුවහම ශෝක කරනවානම්, වැලපෙනවානම්, පපුවේ අත්ගසාගෙන විලාප කියනවානම්, ක්ලාන්ත වෙලා මුළාවට වැටෙනවානම්, මට ආහාරත් අරුචිවෙනවා, මගේ කයත් දුර්වර්ණ වෙනවා මගේ වැඩ කටයුතුත් අතපසු වෙනවා, මගේ සතුරෝ සතුටු වෙනවා, මිතුරෝ නොසතුටු වෙනවා. "මේ විදියට කල්පනා කරන්නේ නැතිව ඒ පෘථග්ජන සාමාන්‍ය පුද්ගලයා අර දිරනසුලු දේ දිරුවහම ශෝක කරනවා, වැලපෙනවා, ක්ලාන්ත වෙලා වැටෙනවා, පපුවේ අත් ගසා ගන්නවා, විලාප කියනවා, මුළාවට පත්වෙනවා. ඒ විදියට ඒ ධර්මය දන්නේ නැති සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයා ශෝකය නමැති විෂ සහිත ඊතලය වැදුනහම තමන්ම සන්තාපයට පත් වෙනවාය කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඒ වගේම ලෙඩ වෙන ස්වභාවය ඇති දේ ලෙඩවෙනකොට, මැරෙන ස්වභාවය ඇති දේ මැරෙන කොට, ගෙවීයන ස්වභාවය ඇති දේ ගෙවීයන කොට, නැසෙන ස්වභාවය ඇති දේ නැසෙන කොට ඒ පුද්ගලයා අර විදියට නුවණින් කල්පනා නොකර දුකට, ශෝකයට, පීඩාවට, පත්වෙනවා.

නමුත් ධර්මය දන්න ආර්යශ්‍රාවකයා ඒ දිරන ස්වභාවය ඇති දේ දිරුවහම නුවණින් මෙහෙම කල්පනා කරනවා "මගේ පමණක්ම දිරන සුලු දේ දිරනවා නොවෙයි. යම්තාක් සත්ත්වයින් මේ ලෝකයේ උපදිනවා නම් ඒ හැම සත්ත්වයාගේම දිරනසුලු දේ දිරනවා. ඉතිං මම දිරනසුලු දේ දිරුවාම ශෝක කරනවානම්, වැලපෙනවානම්, පපුවේ අත් ගසාගෙන විලාප කියනවානම්, ක්ලාන්ත වෙලා මුළාවට වැටෙනවානම් මට ආහාර අරුචි වෙනවා, මගේ කය

දුර්වර්ණ වෙනවා, මගේ වැඩ කටයුතු අතපසු වෙනවා, මගේ සතුරෝ සතුටු වෙනවා, මිතුරෝ අසතුටු වෙනවා. " අන්න ඒ පුද්ගලයා තමාට වැදුනු ඒ ශෝකය නමැති විෂ ඊතලය ඇදලා දාලා, ශෝක නැතිව තමාම නිවීමට පත් වෙනවා කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ වගේම ලෙඩ වෙන ස්වභාවය ඇති දේ ලෙඩ වෙනකොට, මැරෙන ස්වභාවය ඇතිදේ මැරෙන කොට, ගෙවීයන ස්වභාවය ඇති දේ ගෙවී යන කොට නැසෙන දේ නැසෙන කොට තමාට වැදුනු ඒ ශෝක නැමති ඊය ගලවලා දමලා නිවීමට පත්වෙනවා.

බුදු පියාණන් වහන්සේගේ මෙන්න මේ දේශනාව උපකාර කරගෙන තමන්ට ඇතිවුනු ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක, ශෝකය, සංසිඳුවාගත්තු අවස්ථා දෙකකුත් මේ සූත්‍ර දේශනාව සඳහන් වන තැනම සඳහන් වෙනවා.

එක දවසක් දා පසේනදි කොසොල් රජ්ජුරුවෝ බුදු පියාණන් වහන්සේ දකින්න ඇවිල්ලා වැඳලා, එකත්පස්ව හිඳ ගත්තු හැටියෙම පණිවුඩ කාරයෙක් ඇවිල්ලා රජ්ජුරුවන්ගේ කණට කොඳුරලා මල්ලිකා දේවිය කළුරිය කළබව කිව්වා. ඒක අහලා රජ්ජුරුවෝ බොහොම දුකට දොම්නසට පත්වෙලා, හිස පහතට හෙළාගෙන බිම බලාගෙන සිටියා. එතකොට බුදු පියාණන් වහන්සේ මෙන්න මෙහෙම මේ දේශනාව කළා. ඒක අහලා රජතුමා ශෝකය සංසිඳුවා ගත්තා.

ඒ වගේම බුද්ධ පරිනිර්වාණයෙන් පස්සේ සිද්ධවෙච්ච සිද්ධියකුත් සඳහන් වෙනවා. "මුණ්ඩ" කියලා රජ කෙනෙක්

තමන්ගේ ප්‍රියමනාප "භද්‍රා" නමැති දේවිය කළුරිය කළ අවස්ථාවේ දී බොහොම ශෝකයට පත්වෙලා, ආහාර වර්ජනය කරලා, රාජ්‍ය කටයුතු වල පවා නොයෙදී රෑ දවල් දුක් වෙමින් සිටියා. ඒ වගේම තමන්ගේ භාණ්ඩාගාරික ඇමතියා- "පියක" කියන නම ඇති භාණ්ඩාගාරික ඇමතියා- ලවා දේවියගේ සිරුර කල්තබා ගන්න යකඩයෙන් කළ තෙල් ඔරුවක ඒ සිරුර දමලා ඒක දිහා බලමින් දුක් වෙමින් සිටියා. "පියක" කියන භාණ්ඩාගාරික ඇමතියා කල්පනා කරලා රජතුමාගේ මේ ශෝකය සංසිඳුවීමට පැළලුප් නුවර කුක්කුටාරාමයේ ඒ කාලයේ වැඩ විසූ නාරද ස්වාමීන් වහන්සේට ළඟට රජ්ජුරුවන් කැඳවාගෙන ගියා. ඒ නාරද ස්වාමීන් වහන්සේත් මෙන්න මේ බුද්ධ දේශනාවම ඒ රජතුමාට දේශනා කළා. ඒක අහලා රජ්ජුරුවෝ තමන්ගේ ශෝකය සංසිඳුවා ගත්තා. ඒ වගේම මේ ධර්ම කොට්ඨාශය හඳුන්වන්නේ මොන නමින්ද කියලත් ඒ ස්වාමීන් වහන්සේගෙන් ඇසුවා. ඒ ස්වාමීන්වහන්සේ කිව්වා මේ ධර්ම කොට්ඨාශය හැඳින්වෙන්නේ "සොක සල්ලහරණ" කියන නමින් ය කියලා: ශෝකය නැමැති ඊතලය ඇද දැමීම පිළිබඳ දේශනාව කියන නමින්.

අංගුත්තර නිකායේ තික නිපාතයේ දැක්වෙනවා 'අමතාපුත්තික භය' තුනක් ගැන බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරන සූත්‍රයක්. 'අමතාපුත්තික භය' කියලා කියන්නේ මවට පුතා රැකගන්න බැහැ, පුතාට මව රැකගන්න බැහැ, අන්න ඒ විදියේ අනතුරුදායක අවස්ථාවන්. බුදු පියාණන් වහන්සේ පළමුවෙන්ම මෙන්න මෙහෙමයි සංඝයා වහන්සේලා අමතල ප්‍රකාශ කරන්නේ; "මහණෙනි ධර්මය නොදත්

පෘථග්ජනයා අමතාපුත්තික භය තුනක් තියනවාය කියලා කියනවා. මොනවද ඒ භය තුන? මවට පුතාත්, පුතාට මවත්, රැකගන්න බැරි අවස්ථා තුන මොනවද? ඔන්න මහා ගින්නක් පැතිරිලා ගම් නියම්ගම් නගර දැවීගෙන පිළිස්සීගෙන යනවා. ඒ වගෙ භයානක අවස්ථාවක මවට පුතා හමුවෙන්නේ නැහැ. පුතාට මව හමුවෙන්නෙ නැහැ. මවට පුතා බේරගන්න බැහැ. පුතාට මව බේරගන්න බැහැ. ඒ පළමු වැනි අමාතාපුත්තික භයයි. ඊළඟට ඒ වගේම මහ වැස්සක් වැහැලා ජල ගැල්මක් ඇතිවෙනවා. ඒ ජලගැල්මෙන් ගම් නියම්ගම් නගර ගසාගෙන යනවා. ඒ වගේ භයානක ජල ගැල්මකට අහුවෙලා එහෙම මනුෂ්‍යයින් ගසාගෙන යන අවස්ථාවක මවට පුතා බේරගන්න බැහැ. පුතාට මව බේරගන්න බැහැ. ඕක දෙවන අමතාපුත්තික භය කියලා සාමාන්‍ය ලෝකයා ව්‍යවහාර කරනවා, පෘථග්ජනයා ව්‍යවහාර කරනවා කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කළා. ඒ වගේම කැළෑවක සැඟවිලා ඉන්න හොරුන් ශක්තිමත් වෙලා ගම් නියම්ගම් නගර කොල්ල කන්න පටන් ගත්තහම ඒ ජනපදවල ඉන්න අය රථ වාහනවල නැගලා පලායන්න පටන්ගන්නවා පණ බේරගන්න. එබඳු අවස්ථාවකත් මවට පුතා බේරගන්නත් බැහැ. පුතාට මව බේරගන්නත් බැහැ. මවට පුතා හමුවෙන්නේ නැහැ. පුතාට මව හමුවෙන්නේ නැහැ. මෙන්න මේ විදිහේ භයානක අවස්ථාවලට සාමාන්‍ය ලෝකයේ අමාතාපුත්තික භය කියලා කියනවාය, නමුත් බුදු පියාණන් වහන්සේ ඒ පෘථග්ජන මතය අනුමත කරන්නේ නැහැ.

බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "මහණෙනි ඒ ධර්මය නොදත් පෘථග්ජනයා අමාතාපුත්තික භය කියලා

කියන්නේ ඇත්ත වශයෙන්ම මවට පුතා හමුවෙන්න පුළුවන්, පුතාට මව හමුවෙන්න පුළුවන්, මවට පුතා බේරගන්න පුළුවන්, පුතාට මව බේරගන්න පුළුවන්, විදියෙ අවස්ථා වලටය; මොකද, ඇතැම් අවස්ථාවක මහ ගින්නක් ඇති වුනත් සමහරවිට මවට පුළුවන් පුතාව බේරගන්න. පුතාට මව බේරගන්න පුළුවන්, ඒ වගේම මහා ජල ගැල්මක් ඇති වුනහම, හොරු කඩා වැදිලා කොල්ලකන අවස්ථාවක; ඒ විදියේ අවස්ථාවල දී සමහරවිට මවට පුතා බේරගන්න පුළුවන් පුතාට මව බේරගන්න පුළුවන්.

නමුත් ලෝකයේ තිබෙනවා ඇත්ත වශයෙන්ම මවට පුතා බේරගන්න බැරි, පුතාට මව බේරගන්න බැරි, අමාතාපුත්තික භය නමින් හඳුන්වන්න පුළුවන් අවස්ථා තුනක්. මොනවද ඒ අවස්ථා තුන? ජරා භය, ව්‍යාධි භය, මරණ භය. මොකද ඒකට හේතුව? දැන් පුතා දිරාපත් වෙනකොට, වයසට යනකොට, මහලු වෙනකොට, මවට බැහැ "අනේ පුතේ, පුතා දිරන්න එපා, පුතා මහලු වයසට පත් වෙන්න එපා, මම ඒ වෙනුවට මහලු වයසට පත්වෙන්නම්" කියලා ඒ පුතාගේ දිරීම තමාපිට පවරා ගන්න. ඒ වගේම මව මහලු වයසට පත් වෙනකොට පුතාට බැහැ "අම්මේ, ඔබ මහලු වයසට පත්වෙන්න එපා. මම ඒ වෙනුවට මහලු වයසට පත් වෙන්නම්" කියලා ඒ දිරීම තමා පිට පවරාගන්න. ඒ වගේම  පුතා ලෙඩ වෙනකොට මවට බැහැ "පුතා ලෙඩ වෙන්න එපා මම ඒ වෙනුවට ලෙඩ වෙන්නම්" කියලා ඒ ව්‍යාධිය තමන්ට පවරා ගන්න. ඒ වගේම මව ලෙඩ වෙනකොට පුතාට බැහැ "අම්මා ලෙඩ වෙන්න එපා මම ඒ වෙනුවට ලෙඩ වෙන්නම්" කියලා ඒ ව්‍යාධිය, රෝගය,

තමාවෙත පවරා ගන්න. ඒ වගේම තමයි පුතා මැරෙනකොට මවට කියන්න බැහැ "පුතා මැරෙන්න එපා මම ඒ වෙනුවට මැරෙන්නම්" කියලා ඒ මරණය තමා වෙත පවරාගන්න. පුතාට බැහැ මව මැරෙන්න යන අවස්ථාවේ දී "අම්මා මැරෙන්න එපා මම ඒ වෙනුවට මැරෙන්නම්" කියලා ඒ මරණය තමා වෙත පවරා ගන්න. මෙන්න මේ විදියට බලනකොට ජරාව, ව්‍යාධිය, මරණය කියන කාරණා තුන ඇත්ත වශයෙන්ම අමාතාපුත්තික භය හැටියට හඳුන්වන්න ඕන" කියලා ඒ විධියට සංඝයා වහන්සේලාට වදාළා.

අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයෙ දකින්න ලැබෙන 'ඨාන' සූත්‍රයේ දී බුදු පියාණන් වහන්සේ ස්ත්‍රී - පුරුෂ - ගිහි - පැවිදි භේදයක් නැතිව හැම කෙනෙකු විසින්ම නිතර සිහිපත් කළයුතු කාරණා පහක් දක්වනවා. "මහණෙනි, මෙන්න මේ කාරණා පහ ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගිහියකු විසින් හෝ පැවිද්දකු විසින් හෝ නිතර ප්‍රත්‍යවේක්ෂා කළ යුතුය, නුවණින් සළකා බැලිය යුතුය, සිහිපත් කළයුතුය කියලා. මොනවද ඒ කාරණා පහ? "මම ජරාවට - දිරීමට - පත්වන ස්වභාවය ඇත්තෙක් වෙමි, දිරීමට පත්වීමේ තත්ත්වය නොයික්ම වූ කෙනෙක් වෙමි" කියන මේ කාරණය; ස්ත්‍රියක විසින් හෝ පුරුෂයකු විසින් හෝ ගෘහස්ථයකු විසින් හෝ පැවිද්දකු විසින් හෝ නිතර ප්‍රත්‍යවේක්ෂා කළයුතුය, නුවණින් සළකා බැලිය යුතුය කියලා. දෙවැනි කාරණය; "මම ලෙඩවෙන ස්වභාවය ඇත්තෙක් වෙමි, ලෙඩවීමේ ස්වභාවය නොයික්ම වූ කෙනෙක් වෙමි" කියන කාරණය. ඒ වගේම තුන් වෙනි කාරණය; "මම මැරෙන ස්වභාවය ඇත්තෙක් වෙමි, මරණය නොයික්ම වූ කෙනෙක්

වෙමි." හතරවෙනි කාරණය. "සියළු ප්‍රියමනාප අයගෙන් වෙන්වීමක්, වියෝවීමක්, මට ඇතිවෙනවා." පස්වැනි කාරණය "මට මගේය කියන්න පුළුවන් දේ මා කරන කර්මයයි; මගේ දායාදය මා කරන කර්මයයි; මා හට ගත්තේ කර්මයෙන්; මගේ නෑය කර්මයයි; මට පිහිටත් කර්මයයි; හොඳ හෝ නරක කර්මයක් මා කරනවානම් ඒ කර්මයේ දායාදකරුවත් මමයි."

මේ කාරණා පහ නිතර සිහිපත් කිරීමේ වැදගත්කමත් බුදු පියාණන් වහන්සේ ඒ එක්කම පෙන්නලා දෙනවා. "මහණෙනි, මේ සත්ත්වයින් තුළ තිබෙනවා තරුණ වයස පිළිබඳව තරුණමදයක්, යෞවනමදයක්. ඒ මත්වීම නිසා සත්ත්වයා කයින් වචනයෙන් මනසින් දුසිරිතයෙහි හැසිරෙනවා. යම්කෙනෙක් නිතර සිහිපත් කරනවානම් අර ජරාව පිළිබඳ කාරණය, තමා මහලු වියට පත්වන බව නිතර සිහිපත් කරනවානම්; ඒ තරුණමදය එක්කෝ සම්පූර්ණයෙන්ම නැතිවෙලා යනවා; එහෙම නැත්නම් තුනීවෙනවා. ඒ වගේම මේ සත්ත්වයා තුළ තිබෙනවා නීරෝගී බව නිසා ඇතිවන මත්වීමක්, මාන්නයක්. යම්කෙනෙක් තමා ව්‍යාධියට පත්වෙනබව, ලෙඩවෙනබව, නිතර සිහිපත් කරනවානම් අර ඇතිවුනු ආරෝග්‍යමදය කියලා කියන නිරෝගී බව නිසා ඇතිකර ගත්ත මත්වීම - මාන්නය - ඒක සම්පූර්ණයෙන්ම නැතිවෙලා යනවා. එහෙම නැත්නම් ඒක තුනී වෙනවා. සත්ත්වයින් තුළ තිබෙනවා ඒ වගේම ජීවිතය පිළිබඳ මත් වීමක් - ජීවිතමදයක්. තමා ජීවත් වෙනවා කියන අදහස තුළින් ඇතිකර ගන්නා මාන්නයක්. යම් කෙනෙක් තමා මරණයට පත්වන බව නිතර මෙනෙහි

කරනවානම් අර ජීවිතමදය එක්කෝ සම්පූර්ණයෙන් නැතිවෙනවා, එහෙම නැත්තම් තුනීවෙනවා. ඊළඟට ඒ වගේම සත්ත්වයන් තුළ තිබෙනවා තමාට ප්‍රිය - මනාප අය පිළිබඳව රාගයක්, ඇල්මක්. ඒ රාගය නිසා කයින් - වචනයෙන් - සිතින් - දුසිරිතයෙ හැසිරෙනවා. යම් කෙනෙක් ප්‍රිය-මනාප හැම අයගෙන්ම මට වෙන්වීමක් වියෝවීමක් තියෙනවා කියලා නිතර මෙනෙහි කරනවනම් අන්න අර කියාපු ප්‍රියයන් පිළිබඳව දැඩි ඡන්දරාගය නැතිවෙනවා. ඒ එක්කම කයින් වචනයෙන් සිතින් කෙරෙන දුසිරිතෙන් වැළකෙන්න පුළුවන් වෙනවා."

පස් වෙනුවට කියවෙන කර්මය පිළිබඳ සිහිකිරීම ගැන බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ මෙහෙමයි. "මහණෙනි සත්ත්වයින් තුළ තිබෙනවා කාය දුශ්චරිතයට ඇදී යන ස්වභාවයක්. යම් කෙනෙක් කර්මයට තමන්ට වගකියන්න සිද්ධ වෙනබව නිතර සිහිපත් කරනවා නම්, ඒ දුසිරිතට ඇදීයන ස්වභාවය එක්කෝ සම්පූර්ණයෙන්ම නැතිවෙලා යනවා, එහෙම නැත්නම් තුනී හෝ වෙනවා."

ඊළඟට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "ඒ කියාපු කාරණා පහම යම්කිසි ආර්ය ශ්‍රාවකයෙක් වඩා පුළුල් අන්දමින් නිතර සිහිපත් කරනවා නම් විශ්ව සාධාරණ ධර්මතාවන් හැටියට, ඒ කියන්නේ මා, පමණක් නොවෙයි ජරාව ස්වභාවය කොට ඇත්තේ, ජරාව නොයික්මවූයේ, යම්තාක් සත්ත්වයන් මේ භවයට එනවා නම් ඒ හැම සත්ත්වයම ජරාව ස්වභාවය කරගෙන ඇත; ජරාව ඉක්මවා නැත; ආදී වශයෙන් මේ එක් එක් කාරණය ගැන මෙනෙහි

කරනවානම් ඒ තැනැත්තාට සසර කලකිරීම තුළින් සසරට ඇති බැමි කඩාගෙන අනුසය - සංයෝජන - ධර්ම ආදිය නැති කරලා උතුම් අමා මහ නිවන පවා ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් වෙනවාය" කියලා.

මජ්ඣිම නිකායේ දේවදූත සූත්‍රයෙත් අංගුත්තර නිකායේ දේවදූත වග්ගයෙත් ජරා ව්‍යාධි මරණ කියන කාරණා තුන දේවදූතයින් හැටියට හඳුන්වලා දීලා තියෙනවා. මනුෂ්‍යයින් කාය වාක් මනෝ දුශ්චරිත වලින් මුදා ගැනීමට උපකාර වන දේවදූතයින් හැටියට.

කයින් වචනයෙන් සිතින් දුසිරිතයෙ හැසිරිලා යම් කෙනෙක් නිරයේ උපන්නහම යම රජ්ජු අසනවා "ඇයි නුඹ දැක්කේ නැද්ද, මනුෂ්‍ය ලෝකයේ ඉන්න කාලෙ; හොඳටම ජරා - ජීර්ණ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හැරමිටි වාරුවෙන් වෙව්ලමින් යන එනවා? දැකලා කල්පනා කළේ නැද්ද, මමත් මේ වගේම මහලු වයසට පත් වෙනවා; ඒක නිසා කයින් වචනයෙන් සිතින් සුචරිතයේ හැසිරෙන්න ඕන කියලා; "මම ප්‍රමාදයට වැටුනා, ඒක නිසා මට එහෙම කරන්න බැරි වුනා." කියලා පිළිතුරු දුන්නහම "එහෙමනම් ඒ ප්‍රමාද වීමේ විපාක දැන් විඳින්න සිද්ධවෙනවා" කියලා යමරජ්ජු කියනවා, "ඒ වගේම හොඳටම ගිලන්ව තමන්ගේ මළ මූත්‍රයෙහි ගැලිල එක්තැන් වෙලා ඉන්න රෝගියෙක් දැකලා කල්පනා කරේ නැද්ද තමනුත් මේ තත්ත්වයට පත්වෙනවා කියලා; ඉදිමුණු නිල්වුනු පණුවන් දමන මලසිරුරක් දැකලා කල්පනා කරේ නැද්ද තමනුත් මේ තත්ත්වයට පත්වෙනවා කියලා." ඒ හැම ප්‍රශ්නයකටම "මම ප්‍රමාදයට වැටුනා" කියලා පිළිතුරු දුන්නහම යම රජ්ජු කියනවා "එහෙනම් ඒ ප්‍රමාදයට විපාකය

දැන් විඳින්න සිද්ධ වෙනවා" කියල. ඒ විධියට ජරා ව්‍යාධි මරණ කියන කාරණා තුන ලෝක සත්ත්වයාට පාඩම් උගන්වන දේව දූතයින් හැටියට ඉදිරිපත් කරලා තියෙනවා. කුසල් මාර්ගයේ ගමන් කිරීමට සංවේගවස්තු හැටියටත් ජරා ව්‍යාධි මරණ කියන කාරණා දක්වල තියෙනවා.

ගිරිමානන්ද සූත්‍රයේදී, ආදීනව - සංඥාව යටතේ බුදු පියාණන් වහන්සේ මේ ශරීරයේ ඇතිවන ආබාධ පිළිබඳ දීර්ඝ ලේඛනයක් දෙන්නෙ, මේ ශරීරය බොහෝ ආදීනව සහිත, දුක් සහිත, එකක් බව නිතර මෙනෙහි කිරීම නිවනට උපකාර වන නිසයි. වෙන එකක් තබා කුසගින්න පිපාසය මළ - මූත්‍ර පහ කිරීම කියන කාරණා පවා මේ ශරීරයේ ආබාධ හැටියට දක්වලා තියෙනවා. කොයිතරම් ආසාවෙන් රැක බලාගන්න උත්සාහ කළත් මේ ශරීරය එකම රෝග කූඩුවක් බව යථාර්ථයට අනුව සිහිපත් කිරීම රෝගී අවස්ථාවක කෙනෙකුට හිත හදාගැනීමට උපකාර වෙනවා වගේම සසර කලකිරීම තුළින් නිවන් ප්‍රත්‍යක්ෂ කර ගන්නත් උපකාර වෙනවා. විශේෂයෙන්ම තමන් මැරෙන බව නිතර සිහිපත් කිරීම නිවන් ලබාදෙන ප්‍රබල භාවනාවක් හැටියට බුදුපියාණන් වහන්සේ සූත්‍ර රාශියකම වර්ණනා කරලා තිබෙනවා.

අංගුත්තර නිකායෙ අට්ඨක නිපාතයේ එන නාදික සූත්‍රයේ දී බුදු පියාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතලා ප්‍රකාශ කරනවා " මහණෙනි, වඩන ලද බහුල වශයෙන් පුරුදු කරන ලද, මරණ සතිය මහත් -ඵල මහානිසංස වෙයි. එය නිවනෙහිම ගැලී සිටි, නිවනම කෙළවර කොට සිටි භාවනාවකි" ; "මහණෙනි නුඹලා මරණ සතිය වඩනවද?" කියලා ඊළඟට ඇහුව. එතකොට එක භික්ෂූන් වහන්සේ

නමක් කියනවා "ස්වාමීනි, මම මරණ සතිය වඩනවා" "කොහොමද ඔය නම මරණ සතිය වඩන්නේ?" "ස්වාමීනි, මට මෙන්න මෙහෙම හිතෙනවා, මට එක රැයක් හා දවාලක් භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය මෙනෙහි කරමින් ජීවත් වෙන්න ඇත්නම් ඒක ලොකු දෙයක්" කියලා. ඊළඟට තව භික්ෂුවක් ප්‍රකාශ කරනවා "ස්වාමීනි, මමත් මරණ සතිය වඩනවා". "කොහොමද ඔය නම මරණ සතිය වඩන්නේ? "ඒ භික්ෂුන් වහන්සේ කියනවා "ස්වාමීනි, මට මෙන්න මෙහෙම හිතෙනව. මට එක දවල් කාලයක් ජීවත් වෙන්න පුළුවන් නම් භාග්‍යවතුන් වහන්සේගේ අවවාද මෙනෙහි කරමින් ඒක මම ලොකු දෙයක් හැටියට සළකනව." ඊළඟට තුන්වන භික්ෂුව කියනවා "මමත්, ස්වාමීනි, මරණ සතිය වඩනවා." "කොහොමද ඔය නම මරණ සතිය වඩන්නේ?." "මට හිතෙනවා අඩ දවාලක් ජීවත් වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය අනුව, ඒක මට ලොකු දෙයක්; ලොකු ලැබීමක් " කියලා ඊළඟට හතරවන භික්ෂුවක් ප්‍රකාශ කරනවා "ස්වාමීනි, මමත් මරණ සතිය වඩනව." "කොහොමද ඔය නම වඩන්නේ මරණ සතිය?" "මට හිතෙනවා එක පිණ්ඩපාතයක් වළඳන කාලයක් තුළ මට ජීවත් වෙන්න ඇත්නම් භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින්, ඒක ලොකු දෙයක් කියලා. "ඊළඟට පස් වෙනි භික්ෂුවක් කියනව "මමත් මරණ සතිය වඩනව". "කොහොමද?" "මට හිතෙනවා පිණ්ඩපාතයෙන් අඩක් වළඳන තුරු මට ජීවත් වෙන්න ඇත්නම්; භාග්‍යවතුන්ගේ අනුශාසනය අනුව ඒක මට ලෙකු දෙයක් කියල." ඊළඟට හය වෙනුව භික්ෂුවක් ප්‍රකාශ කරනවා "මමත් මරණ සතිය වඩනව." "කොහොමද ඔය නම මරණ සතිය වඩන්නේ?"

"මට හිතෙනවා ස්වාමීනි, බත් පිඩවල් හතරක් පහක් විකලා ගිලිනතුරු මට ජීවත් වෙන්න ඇත්නම්; භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින්, ඒක ලොකු දෙයක් කියලා." ඊළඟට හත්වන භික්ෂුවක් ප්‍රකාශ කරනව "මමත් මරණ සතිය වඩනවා" "කොහොමද?" "මට එක බත් පිඩක් හපලා ගිලින තුරු ජීවත් වෙන්න ඇත්නම් ඒක ලොකු දෙයක් කියලා මා හිතනවා" ඊළඟට අටවෙනි භික්ෂුව ප්‍රකාශ කරනවා "මමත් මරණ සතිය වඩනවා." කොහොමද මරණ සතිය වඩන්නේ?." "මට හිතෙනවා භාග්‍යවතුන් වහන්ස, මම ගත්තු හුස්ම හෙළනතුරු, හෙළූ හුස්ම වෙනුවට හුස්මක් ගන්න තුරු මට භාග්‍යවතුන් වහන්සේගේ අනුශාසනය මෙනෙහි කරමින් ජීවත් වෙන්න ඇත්නම් ඒක ලොකු දෙයක් කියලා."

මේ භික්ෂුන් වහන්සේලා අට නමම තම තමන් මරණ සතිය වඩන ආකාරය විස්තර කළාට පස්සේ බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා "මේ අට නම අතුරෙන් මුල් හය නම ප්‍රමාදව වාසය කරනවය; ඒ අයගේ මරණ සතිය වේගවත් මදිය, ශක්තිමත් මදිය, කියල නිවන් දැකීමට. නමුත් අවසානයේ කියපු දෙනම, ඒ කියන්නේ කටට ගත් බත් පිඩ ගිලිනතුරු ජීවිත් වන භික්ෂුවත්; හුස්ම දෙකක් අතර ජීවත් වන භික්ෂුවත්; අප්‍රමාදීව වාසය කරනවය, නිවන් ප්‍රත්‍යක්ෂ කර ගැනීම සඳහා තියුණු ලෙස මරණ සතිය වඩනවය" කියල ප්‍රකාශ කළා.

මරණ සතිය වැඩීමටත් ජීවිතමදය දුරුකර ගැනීමටත් උපකාරවෙන වටිනා සූත්‍රයක් අංගුත්තර නිකායේ සත්තක නිපාතයෙ දකින්න ලැබෙනව. ඒ සූත්‍රයේ දී බුදු පියාණන්

වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතලා ඈත අතීතයේ වාසය කළ 'අරක' නමැති ශාස්තෘවරයෙකු පිළිබඳ ප්‍රවෘත්තියක් ප්‍රකාශ කරනවා. නොයෙක් සිය ගණන් ශ්‍රාවකයන් ඇතිව සිටිය ඒ ශාස්තෘවරයා තම ශ්‍රාවකයින්ට නිතර කළ ධර්ම දේශනාවක ආරම්භය මෙන්න මේ විදියයි. "බ්‍රාහ්මණයිනි, මනුෂ්‍යයන්ගේ ජීවිතය අල්පය, සුළුය, කෙටිය, බොහෝ දුක් ඇතියේය, බොහෝ දැඩි කරදර ඇතියේය, ප්‍රඥාවෙන් ඒ කාරණය දත යුතුය; කුසල් කළ යුතුය; බඹසර හැසිරිය යුතුය; උපන්නහුට නොමැරීමක් නැත."

ඊළඟට ඒ ශාස්තෘවරයා මනුෂ්‍ය ජීවිතයෙ අල්ප බව, කෙටි බව, පෙන්නුම් කරනව. පළමුවෙනි උපමාව "බ්‍රාහ්මණයිනි, තණ අග පිණිබිඳු යම් සේ හිරු උදාවන විට වහා නොපෙනී යයිද, වැඩිවෙලා නොපවතීද, එසේම මනුෂ්‍යයින්ගේ ජීවිතය තණ අග පිණිබිඳු මෙන් සුළුයි, කෙටියි." දෙවෙනි උපමාව" බ්‍රාහ්මණයිනි, යම් සේ දැඩිපොද ඇති වැසි වසින විට දිය බුබුලු වහා නොපෙනී යනවද වැඩි කල් නොපවතීද, එසේම ජීවිතය දිය බුබුලක් වැනිය." තුන්වන උපමාව "බ්‍රාහ්මණයිනි, යම් සේ දියෙහි දණ්ඩෙන් ඇඳි ඉරක් වහා නොපෙනී යනවද එසේම මේ ජීවිතය දියෙහි දණ්ඩෙන් ඇඳි ඉරක් වගෙයි." හතරවන උපමාව "බ්‍රාහ්මණයෙනි, පර්වතයෙහි හටගත්, දුර බලා යන සැඩ දිය පහර ඇති, අසුවූ හැමදේම ගසාගෙන යන නදිය යම්සේද, ක්ෂණයක් මොහොතක් නොනවතින ගලාබස්නා ඒ නදිය මෙනි, මනුෂ්‍ය ජීවිතය." පස්වෙනි උපමාව "බ්‍රාහ්මණයිනි, යම් සේ ශක්තිමත් පුරුෂයෙක් දිවගට කෙළපිඩක් රැස් කොට මඳ උත්සාහයකින්ම පිටතට දමයිද, එමෙන්ම ජීවිතයද දිවග

කෙළ පිඩ මෙන් වහා ගිලිහී යන දෙයකි." හයවෙනි උපමාව "බ්‍රාහ්මණයිනි, යම් සේ දවස පුරා රත් වූ යකඩ කබලෙක මස් පිඩක් දමන ලද්දේ වහා නොපෙනීයේද, ජීවිතයද ඒ මස් පිඩ වැනිය. හත්වෙනි උපමාව "බ්‍රාහ්මණයිනි, යම්සේ වධයට නියත වූ එළදෙනක් වධක ස්ථානය කරා ගෙන යනු ලබන්නී යම් පාදයක් ඔසවා නම් වධයටම සමීප වෙයිද, මරණයටම ළං වෙයිද, එසේම මනුෂ්‍ය ජීවිතය ද වධයට නියත එළදෙනක බඳුය."

මේ අතීත ප්‍රවෘත්තිය ගෙනහැර පාල ඉවරවෙලා බුදු පියාණන් වහන්සේ පුදුම අන්දමේ කාරණයක් එළිදරව් කරනව. "මහණෙනි, ඒ කාලයේ මනුෂ්‍යයන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු හැටදාහයි; ඒ කාලේ මනුෂ්‍යයින්ට තිබුනේ ආබාධ හයක් පමණයි; ශීතල උෂ්ණ දෙක දැනෙනව, කුසගින්න පිපාසා දෙක දැනෙනව, මළ මූත්‍රා පහ කිරීමේ අවශ්‍යතා තිබෙනවා; අන්න ඒ තරං දීර්ඝ ආයුෂ ඇති, අල්පාබාධ ඇති, මනුෂ්‍යයින් විසූ කාලෙකයි ඒ අරක නමැති ශාස්තෘවරයා තම ශ්‍රාවකයින්ට අර කියාපු විදියේ සංවේග දනවන ධර්ම දේශණාවක් කළේ; නමුත්, මහණෙනි, ඒ දේශණාව වඩාත් ගැලපෙන්නේ මෙන්න මේ කාලයටයි. මක් නිසාද මේ කාලේ කෙනෙක් ජීවත් වෙන්නේ වර්ෂ සීයයි, එහෙම නැත්නම් ඊට ටිකක් වැඩියි."

ඊළඟට බුදු පියාණන් වහන්සේ මේ වර්ෂ සීයක ජීවිත කාලය පිළිබඳ අපූරු අන්දමේ පරිගණනයක් කරනව. "අවුරුදු සීයක් ජීවත් වන කෙනෙක් ජීවත් වන ඍතු ගණන, තුන්සීයයි; මාස ගණන, එක්දහස් දෙසීයයි; අර්ධ මාස ගණන, දෙදහස් හාරසීයයි; රාත්‍රී ගණන තිස් හයදාහයි; අනුභව

කරන බත්වේල් ගණන හැත්තෑ දෙදාහයි." ඒ වගේම බුදු පියාණන් වහන්සේ එතෙන්දි දක්වනවා; අර හැත්තෑ දෙදාහෙන් මව් කිරි බිව්ව කාලයත්, බත් වැරදුනු අවස්ථාවලුත්, අඩු කළ යුතුබව. බත් වැරදුනු අවස්ථාවල් හැටියට සඳහන් වෙන්නෙ, කෝපය නිසා; දුක නිසා; අසනීප නිසා; පෙහෙවස් සමාදන් වීම නිසා; බත් නොලැබීම නිසා; බත් නොගත් අවස්ථාවලුයි.

එතකොට බුදු පියාණන් වහන්සේ දේශනා කළ මේ සූත්‍ර දේශනා ආශ්‍රයෙන් කල්පනා කරලා බලනකොට, ජරාව ව්‍යාධිය මරණය කියන කාරණා තුන නිතර මෙනෙහි කිරීම තුළින් අනිත්‍ය දුඃඛ අනාත්ම කියන මේ ත්‍රිලක්ෂණයම මතු කර ගන්න පුළුවන් වෙනවා. නිවනට උපකාර වන භාවනා හැටියට දැක්වෙන අනිත්‍ය සංඥාව, දුඃඛ සංඥාව, අනාත්ම සංඥාව, අසුභ සංඥාව, ආදීනව සංඥාව ආදිය වඩන්න අවස්ථාව සැළසෙනව.

ඇත්ත වශයෙන්ම කියනව නම් ජරාව ව්‍යාධිය මරණය කියන දේවල් ජීවිතයෙ අවස්ථා හැටියට සැළකිය යුතු නෑ. උපතත් සමඟම දිරීමේ ක්‍රියාවලිය ඇරඹෙනවා. ජීවිතයෙ මුල් අවධියේ දී වැඩීම ප්‍රකටයි; දිරීම අප්‍රකටයි. මැදි වයසෙන් පස්සේ දිරීම වැඩිය ප්‍රකට වන නිසා තමයි ජරා දුක මැදි වයසෙන් පස්සෙ ඇරඹෙන්නක් හැටියට සළකන්නෙ. මේ දිරීමට අත දෙන්නේ ව්‍යාධියයි. ශරීරය එකම රෝග කූඩුවක්! වැඩෙන වේගයට වැඩිය දිරන වේගය වැඩි වෙන කොට රෝග වලට ඉඩ ලැබෙනව. මරණය, ජීවිත පැවැත්මෙ කෙළවරදි සිද්ධවෙන දෙයක් කියලයි අපි සාමාන්‍යයෙන් හිතන්නෙ. මේ ශරීරයෙන් විඥානය ඉවත් වෙලා වැඩකට

නැති දඬු කඩක් වගේ ශරීරය දරදඬු වෙලා නිශ්ක්‍රීය වීම මරණය හැටියට සළකනවා. නමුත් මරණයත් උත්පත්තිය එක්කම ඇවිල්ලා මේ ශරීරය තුළ පැලපදියම් වෙලා ඉන්න එකක්. හුස්ම දෙකක් අතර තියෙන්නේ මරණයයි. ගත්තු හුස්ම හෙළන්න බැරි වුනොත්; හෙළූ හුස්ම වෙනුවට වෙන හුස්මක් ගන්න බැරි උනොත් එතැන මරණයයි. පණකෙන්ද තිබෙන්නේ කොයිතරම් අවදානම් තත්ත්වයකින් ද කියලා ඒ අනුව හිතා ගන්න පුළුවන්.

එහෙම බලනකොට ජරාව, ව්‍යාධිය, මරණය, මුළු ජීවිත පැවැත්ම පුරාම විහිදුනු දේවල් තුනක්. ඒ නිසා ජරාවත් ව්‍යාධියත් මරණයත් නිතරම මේ ශරීර කූඩුව තුළම තිබෙනව කියලා නුවණින් මෙනෙහි කිරීම යථාර්ථයට සිත ගෙන ඒමක් වෙනව. මේ මෙනෙහි කිරීම හරියාකාර පුරුදු කර ගත්තොත් අපට ජීවිතයේ සැඟෑ අඳුර තුළින්ම ප්‍රඥා ආලෝකය මතු කර ගන්න පුළුවන් වෙනව ඇති. අවසන් හුස්ම සැනසුම් සුසුමක්ම කරගන්න පුළුවන් වෙනව ඇති.

(කුඩා කල අපට මෑණියන් ඉගැන්වූ මේ ගී පෙළ කිසියම් පැරණි කවියකුගේ නිබන්ධයකි.)

# මහලු වයස

1. සසර - සරණ - සතට - දුබල -

    මහලු - වයස - පැමිණි - කලට -

    ගතද - හැකිළෙ - වතද - මැළවෙ -

    සෙලවෙතේ - දතා.

2. එවර - දෙඇස - නොපෙනෙ - දෙකණ -

    බිහිරි - ගතිය - සමග - දෙතොල -

    සැලුම - යුතුව - කටිනි - හඩද -

    ලො - ලො - ලො- ගා - යතා.

3. අදර - ගුණැති - හිතැති - මිතුරො -

    නෑයො - සමග - ඉවත - බලති -

    පණසෙ - විසුව - පෙමැති - කතද -

    නුරුස්සා - යතා.

4. ඉඳු - නිල්මිණි - දෙකක් - සදිසි -

දෙනෙත් - සුදුව - කබ ගලමින්

ගිලුණු - බැවින් හඳුනන්නට -

බැරිය - දුටුදනා

5. මොනර - පිල්සෙ - නිල්වන් - කෙස් -

වැටිය - සුදුව - කපු කූල්ලක්

විලස - තිබ් - ටිකෙන් - ටිකම -

තට්ටෙ - පෑදුනා

6. මිහිරි - හඬින් - දන - මන - ගත් -

කැකුළු - වදන් - බැරිව - කිසිත්

කබල් - බෙරය - ගසන - විලස

කලක් - කළ - කතා

7. කැකුළු - කොඳස - තිබුන - දසන් -

කෙතකට - බැඳි - වැට - විලසින්

තිබ් - පසුව - වැටි - ගියෙන්

ලොඹුව - හැකිළුනා

8. ලොබු - දෙකොණින් - කෙළ - පෙරමින්-

ලොල් - ලොල් - ගා - කියන - බසට

මෙකල - මෝඩ - කොල්ලො - පෙලක් -

සිනාසෙති - ඉතා

9. රහස් - කියන - විටත් - ඇසුනු -

දෙකන් - බිහිරි - වෙලා - වගේ

හෙණ - ගැහුවත් - පිටිපස්සට-

සද්දයක් - නැතා

10. ගෙදර - සිටින - ජාත - පුතුද -

අපිය - කරයි - දකින - කලට

බලව - තිබෙන - දුකෙක - මහත -

මේ ජරා - පතා

11. අනේ - බලනු - මැනව - සසර -

ජරා - මරුව - දෙන - හිරිහැර

මෙලොව - සැමට - වෙති - මේ හැම -

වඩවි - මෙත් - සිතා.

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරන ලද ග්‍රන්ථ

| | ග්‍රන්ථ නාමය | | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | නිවනේ නිවීම | පළමු වෙළුම | 11000 |
| 02. | නිවනේ නිවීම | දෙවන වෙළුම | 8000 |
| 03. | නිවනේ නිවීම | තෙවන වෙළුම | 5000 |
| 04. | නිවනේ නිවීම | සිවුවන වෙළුම | 6000 |
| 05. | නිවනේ නිවීම | පස්වන වෙළුම | 5000 |
| 06. | නිවනේ නිවීම | සයවන වෙළුම | 3500 |
| 07. | නිවනේ නිවීම(පුස්තකාල මුද්‍රණය) | ප්‍රථම භාගය(1-6වෙළුම්) | 500 |
| 08. | නිවනේ නිවීම | සත්වන වෙළුම | 3000 |
| 09. | නිවනේ නිවීම | අටවන වෙළුම | 3000 |
| 10. | නිවනේ නිවීම | නවවන වෙළුම | 5000 |
| 11. | නිවනේ නිවීම | දසවන වෙළුම | 5000 |
| 12. | නිවනේ නිවීම | එකොළොස්වන වෙළුම | 3000 |
| 13. | පහන් කණුව ධර්ම දේශනා | පළමු වෙළුම | 13000 |
| 14. | පහන් කණුව ධර්ම දේශනා | දෙවන වෙළුම | 12000 |
| 15. | පහන් කණුව ධර්ම දේශනා | තෙවන වෙළුම | 6000 |
| 16. | පහන් කණුව ධර්ම දේශනා | සිවුවන වෙළුම | 7000 |
| 17. | පහන් කණුව ධර්ම දේශනා | පස්වන වෙළුම | 6000 |
| 18. | පහන් කණුව ධර්ම දේශනා | සයවන වෙළුම | 4000 |
| 19. | පහන් කණුව ධර්ම දේශනා | සත්වන වෙළුම | 4000 |
| 20. | 'හිතක මහිම' | පළමු වෙළුම | 8000 |
| 21. | 'හිතක මහිම' | දෙවන වෙළුම | 5000 |
| 22. | උත්තරීතර හුදෙකලාව | | 9000 |
| 23. | විදසුන් උපදෙස් | | 8000 |
| 24. | චලන චිත්‍රය | | 3000 |
| 25. | දිය සුළිය | | 6000 |
| 26. | Towards A Better World | | 6000 |
| 27. | Seeing Through | | 3000 |
| 28. | Nibbana - The Mind Stilled | Volume I | 5000 |
| 29. | Nibbana - The Mind Stilled | Volume II | 3000 |
| 30. | Nibbana - The Mind Stilled | Volume III | 3000 |
| 31. | Nibbana - The Mind Stilled | Volume IV | 5000 |
| 32. | Nibbana - The Mind Stilled | Volume V | 2000 |
| 33. | The Magic of the Mind | | 2000 |

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම් :-

ජී. ටී. බණ්ඩාර, ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර, කොළඹ 5.
දු.ක. - 0112-508173, 2592747 - 48

# වෙනත් කෘති

*1. Concept and Reality in Early Buddhist Thought -(1971)
*2. Samyutta Nikaya - AnAnthology, Part II - Wheel No, 183/185 -(1972)
*3. Ideal Solitude - Wheel No, 188 - (1973)
*4. The Magic of the Mind - (1974)
*5. උත්තරීතර හුදෙකලාව -'දම්සක්' අංක 172/173 - (1990)
-එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
6. Towards Calm and Insight - (1991)
7. විදසුන් උපදෙස් - (1996)
8. නිවනේ නිවීම - (1997-2004)
-ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහා භාරකාර දෙපාර්තමේන්තුව
(සම්පූර්ණ පොත වෙළුම් 11 කින් නිකුත් වී ඇත.)
9. From Topsy - turvydom to Wisdom -Volume 1 - (1998)
(Essays written for 'Beyond the Net, - A website on the Internet
- Website address http:// www.beyond thenet.net)
10. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම - (1999)
11. Seeing Through - (1999)
12. හිතක මහිම - 1 - (1999)
13. නිවනේ නිවීම - ප්‍රථමභාගය - (1-6 වෙළුම්) - පුස්තකාල මුද්‍රණය(2000)
14. හිත තැනීම - (2000)
15. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
16. Towards A Better World -Translation of 'Lo-wada-Sangarava' - (2000)
17. පැවැත්ම හා නැවැත්ම - (2000)
18. ඇති හැටි දැක්ම - (2001)
19. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
20. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
21. කය අනුව ගිය සිහිය - (2001)
22. මා-පිය උවැටන - (2002)
23. ප්‍රතිපත්ති පූජාව - (2003)
24. Nibbana - The Mind Stilled - Volume I - (2003)
25. පහන් කණුව ධර්ම දේශනා - 4 වෙළුම - (2003)
26. අබිනික්මන - (2003)
27. හිතකමහිම - 2 - (2003)
28. පහන් කණුව ධර්ම දේශනා - 5 වෙළුම (2005)
29. පහන් කණුව ධර්ම දේශනා - 6 වෙළුම (2006)
30. Nibbana - The Mind Stilled - Volume II - (2005)
31. Nibbana - The Mind Stilled - Volume III - (2005)
32. Nibbana - The Mind Stilled - Volume IV - (2006)
33. Nibbana - The Mind Stilled - Volume V - (2007)
34. The Magic of the Mind - (2007)
35. පහන් කණුව ධර්ම දේශනා - 7 වෙළුම (2009)

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර